සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 1

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 5 | 2021 අගෝස්තු මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණී මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 10).පාඩම- සිංහලයින් අවදි කළ නායකයා

ආදරණීය දුවේ පුතේ අපි පසුගිය සති වලදී සුවිශේෂ බෞද්ධ චරිත කීපයක්ම හඳුනා ගත්තා නේද?

ඉතින් මම අද ඔයාලත් එක්ක කතා කරන්නේ අපගේ දැය පුබුදු කරමින් බෞද්ධ ආගමට නිසි තැන ලබා දීමට ක්‍රියා කළ උදාර වීරවරයෙක් ගැනයි.

හින්දු භක්තිකයන් සතු ඉන්දියාවේ බුද්ධගයාව බෞද්ධයන්ට උරුම කර දුන් එතුමාගේ රූපයක් තමයි මේ තියෙන්නේ.



කෝ බලන්න කියන්න මේ ඡායාරූපයේ ඉන්නේ කවුද කියලා.එහෙමනම් මගෙ දරුවන් අපේ ජාතික විරුවන් අතර ඉහළින්ම සිටින මෙතුමා ගැන තොරතුරු දැන ගන්න ඔයාලා ගොඩක් ආසයි නේද?

එහෙනම් මගේ පුතේ ඔයාලගේ බුද්ධ ධර්මය පොතේ 10 වන පාඩම හොඳින් කියවා ගනිමුකෝ.ලක් මැණියන් වෙනුවෙන් උදාර සේවයක් කළ මෙතුමා පිළිබඳ වැකි 5ක් ලියමු නේද?

එහෙමනම් දරුවනේ ඔයාලා පහත ප්‍රශ්න වලටත් පිළිතුරු ලියමුකෝ.

1).අනගාරික ධර්මපාලතුමා වාද විවාද කිරීමේ ශක්තිය ලබා ගත්තේ කාගෙන්ද?

2).පරම විඥනාර්ථ බෞද්ධ සමාගම ආරම්භක කළේ කවුද ?

3).අනගාරික ධර්මපාලතුමාගේ දේශන වලදී නිතර ප්‍රකාශ කළ වදන් මොනවාද?

- මෙතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ අපගේ ජීවිතයට එකතු කර ගනිමු.